දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2011

බ/12//02/අයවැය/2010
මුදල් අංශය,
බන්ධනාගාර මූලස්ථානය.
2011.01.04

සියළුම කොමසාරිස්වරුන්,
සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්,
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන්,

## වාර්ෂික විසර්ජන ගිණුම සකස් කිරීම - 2010

150 වන මුදල් රෙගුලාසිය හා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක 213/2010 හා 2010.12.06 වන දිනැති චක්‍රලේඛය අනුව ගණන් දීමේ නිලධාරීන් හා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් 2009 වර්ෂයට අදාල විසර්ජන ගිණුම පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු බව මා වෙත දන්වා ඇත.

02. 2010 වර්ෂයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීම සඳහා මෙ සමඟ අමුණා ඇති පහත නම් සඳහන් ආකෘති පත්‍ර හා එහි සඳහන් උපදෙස් අනුව නිවරදිව සකස් කර 2011.01.30 දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු කරන මෙන් සියළුම මාණ්ඩලික නිලධාරීන්ට කාරුණිකව දන්වමි. වාර්ෂික විසර්ජන ගිණුමේ අඩුපාඩු හෝ වැරදි දත්ත ඇතුලත් වුවහොත් විගණකාධිපතිවරයා විසින් ඒ පිළිබඳව පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව වෙත යොමු කිරීමට ඉඩ ඇති බැවින්, ඔබ ආයතනය විසින් ලබා දෙන තොරතුරු වල නිරවද්‍යතාවය ගැන ආයතන ප්‍රධානීන්ගේ පෞද්ගලික අවධානය යොමුවිය යුතු බව විශේෂයෙන් අවධාරණය කරමි.

i. බැරකම් පිළිබඳ ප්‍රකාශය
ii. පාඩු හා අලාභ හානි පිළිබඳ ප්‍රකාශය
iii. ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව
iv. අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

03. බන්ධනාගාර මූලස්ථානයට අදාල විස්තර ලබා දීමේ දී අදාල අංශ වෙතින් (පාලන, සැපයුම්, ඉංජිනේරු, සුභ සාධක ) තොරතුරු ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම අදාල සියළුම මාණ්ඩලික නිලධාරීන් විසින් පියවර ගත යුතුය.

04. බැරකම් ලේඛණයට ඇතුලත් නොකරන කිසිම බැරකමක් සඳහා 2011 වසරේ ප්‍රතිපාදනවලින් ගෙවීම නොකිරීමට බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වග බලා ගත යුතුය.

05. විසර්ජන ගිණුම සකස් කිරීම සම්බන්ධව යම් පැහැදිලි කර ගැනීමක් වෙතොත් බන්ධනාගාර කොමසාරිස් (මුදල්), නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) හෝ සහකාර කොමසාරිස් (මුදල්) අමතන මෙන් වැඩි දුරටත් සඳහන් කරමි.

වී.ආර්. සිල්වා ආර්ඩබ්ලිව්.පී .යූඑස්පී එන්ඩියූ අයිජී
මේජර් ජනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

වී.ආර්. සිල්වා ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩියූ අයිජී
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පිටපත :- 01. විගණකාධිපති
02. රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

# බැරකම් පිළිබඳ ප්‍රකාශය ( 2010.12.31 දිනට නොගෙවූ හිඟ බිල්පත් විස්තර)

බන්ධනාගාර ආයතනයේ නම :-

| ණය හිමියාගේ නම * | වගකීම පිළිබඳ විස්තර (සේවාව හෝ භාණ්ඩ මිලදී ගැනීම විස්තර) | අදාල වර්ෂය හා මාසය ( අදාල භාණ්ඩය හෝ සේවාව ලබා ගත් මාසය) | වැය විෂය සංකේතය | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01. අමාත්‍යාංශ රජයේ දෙපාර්තමේන්තු | | | | |
| 1........................................ | | | | |
| 2........................................ | | | | |
| 02. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | |
| 1........................................ | | | | |
| 2........................................ | | | | |
| 03. පෞද්ගලික අංශය | | | | |
| 1........................................ | | | | |
| 2........................................ | | | | |

**උපදෙස් :-**

01. 2010 වර්ෂය තුලදී භාණ්ඩ මිලදී ගැනීම් / සේවාවන් ලබා ගැනීම් සඳහා සැපයුම්කරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, රජයේ හෝ පුද්ගලික ආයතන සඳහා ගෙවිය යුතු බිල්පත් 2010.12.31 දිනට පෙර ගෙවීමට නොහැකි වූයේ නම් එම සියළුම වියදම් 2010 වර්ෂයේ බැරකම් ලෙස ගිණුම් ගත කල යුතුය.

02. දුම්රිය ,තැපල්, දේශීය ආදායම් වැනි දෙපාර්තමේන්තු හා බන්ධනාගාර කර්මාන්ත අංශයට ගෙවිය යුතු හිඟ බිල්පත් විස්තර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ඇතුලත් කල යුතුය.

03. පලාත් පාලන ආයතන, විදුලි බල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, සමුපාකාර, සතොස, රාජ්‍ය ඔෟෂධ සංස්ථාව ආදී ආයතනවලට ගෙවිය යුතු හිඟ බිල්පත් විස්තර රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල යටතේ ඇතුලත් කල යුතුය.

04. බන්ධනාගාර නිලධාරීන්ට ගෙවීමට ඇති **හිඟ වැටුප්/අතිකාල/ගමන් වියදම්** වැනි බැරකම් ඇතුලත් කිරීමේදී අදාල මාසය හා වැය විෂය අනුව සාරාංශ කර පෞද්ගලික අංශය යටතේ ඉදිරිපත් කල යුතුය.

05. 2010 වර්ෂයට පෙර වර්ෂවල බැරකම් ඇත්නම් එම බැරකම්ද ඇතුලත් කල යුතුය.

06. අදාල බිල්පත් හා විස්තර නොපමාව ගෙන්වා ගැනීමට කටයුතු කල යුතුය.

07. මු.රෙ. 115 යටතේ අනුමැතිය ලබා ගත් හා ලබා ගැනීමට නියමිත බැරකම්ද ඇතුලත් කල යුතුය.

08. ආන්තිකාරම්, පොදු තැන්පත් ගිණුම්, සුභසාධක අරමුදල් යටතේ ඇති බැරකම් ඇතුලත් නොකළ යුතුය.

# ජංගම නොවන වත්කම් පිළිබඳ වාර්තාව - 2010

බන්ධනාගාර ආයතනයේ නම :-

| වැය විෂය හා වත්කම් කාණ්ඩය | | 2010/01/01 දිනට ආරම්භක ශේෂය | 2010 වර්ෂය තුල එකතු කිරීම් | 2010 වර්ෂය තුල අපහරණ | 2010/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 2101 | වාහන මිලදී ගැනීම | | | | |
| | | | | | |
| 2102 | කාර්යාලීය උපකරණ හා ගෘහ භාණ්ඩ | | | | |
| | | | | | |
| 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම. | | | | |
| | | | | | |
| 2104 | නව ගොඩනැගිලි ඉදිකිරීම. | | | | |
| | | | | | |

උපදෙස් :-

01. 2004/01/01 දිනෙන් පසුව වැය විෂය ප්‍රතිපාදන මගින් අත්පත් කර ගත් හෝ මිලදී ගත් වත්කම් පමණක් ඇතුලත් කල යුතුය.එනම් 2010/01/01 දිනට ආරම්භක ශේෂය ශේෂය වනුයේ 2004/01/01 දින සිට 2009/12/31 දක්වා මිලදී ගත් වත්කම්වලින් අදාල කාලය තුල අපහරණය කරන ලද වත්කම් අඩු කිරීමෙන් පසු ශේෂයයි. ස්ථාවර වත්කම් ලේඛණය අනුව නිවැරදි විය යුතුය.

02. 2010 වර්ෂය තුලදී මිලදී ගත් වත්කම් ඒ ඒ වැය විෂයන් අනුව සඳහන් කල යුතුය. එම වත්කම්වල වටිනාකම අදාල වැය විෂයේ 2010 වර්ෂය තුල කරන ලද මූර වියදමට සමාන විය යුතුය. බන්ධනාගාර මූලස්ථානය විසින් මිලදී ගෙන බන්ධනාගාර ආයතන වෙත ලබා දුන් වත්කම් පිළිබඳ විස්තර උප බන්ධනාගාර යටතේ ඇතුළත් නොකල යුතුය.

03. 2010 වර්ෂය සඳහා අපහරණය කරන ලද විස්තර ඇතුළත් කිරීමේ දී 2004/01/01 දිනෙන් පසුව මිලදී ගත් හෝ අත්පත් කර ගත් වත්කම් වලට අදාලව අපහරණය කිරීම් පිළිබඳව තොරතුරු පමණක් ඇතුළත් කළ යුතුය.

# අස්ථානගත වවුචර පිළිබඳ ප්‍රකාශය - 2010

බන්ධනාගාර ආයතනයේ නම :-

| දිනය | වවුචර අංකය | ආදායකයාගේ නම | ගණන |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**උපදෙස් :-**

01. 2010 වර්ෂයට අදාල සියළුම ගෙවීම් වවුචර කඩිනමින් විගණනයට ඉදිරිපත් කල යුතුය. කිසියම් හේතුවක් නිසා එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වවුචර තිබේ ? පිළිබඳ විස්තර ඇතුලත් කල යුතුය.

02. අස්ථානගත වවුචර නැත්නම් හිස් වාර්තාවක් ඉදිරිපත් කල යුතුය.

# පාඩු හා අලාභ හානි පිළිබඳ ප්‍රකාශය - 2010

බන්ධනාගාර ආයතනයේ නම :-

| අනු අංකය | අලාභයේ/ පාඩුවේ ස්වභාවය විස්තර කරන්න. (අනතුරක් නම් වාහන අංකය හා වර්ගයද සඳහන් කරන්න) | සිද්ධිය වූ දිනය | අලාභයේ/ පාඩුවේ ඇස්තමේන්තු වටිනාකම (රු.) | රක්ෂණ හෝ වෙනත් ක්‍රමයකින් අයකර ගත හැකි මුදල | කපා හැරීමට හෝ අත් හැරීමට ඇති වටිනාකම (රු.) | බන්ධනාගාර මූලස්ථානයට මේ පිළිබඳව වාර්තා කර තිබේද ? |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

උපදෙස් :-

01. 2010 වර්ෂයට අදාල සිදුවීම් පමණක් ඇතුලත් කල යුතුය.

02. අදාල කාලය තුල අලාභයක් හෝ පාඩුවක් සිදුවී නැත්නම් හිස් වාර්තාවක් ඉදිරිපත් කල යුතුය.